දිවි තොර කරගැනීම් යනු වසංගතයක් ලෙසින් පැතිර යාමට හැකි සමාජ-සෞඛ්‍ය ගැටලුවකි. ඒ නිසාම දිවි තොරකරගැනීම් වාර්තා කිරීමේදී මාධ්‍යවේදීන් අනුගමනය කළ යුතු මාධ්‍ය ආචාර ධර්ම මාලාවක් ලෝක සෞඛ්‍ය සංවිධානය සහ Samaritans වැනි ආයතන මගින් නිර්දේශ කොට තිබේ. එහිදී දිවි තොර කරගැනීමක් බවට සැක කෙරෙන සිදුවීමක් වාර්තා කිරීමේදී පවා ආචාර ධාර්මික ප්‍රවේශයක් අවශ්‍ය වේ.

උදාහරණ ලෙස, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව තුළදී කාන්තාවක් දිවි තොර කර ගත් බවට පැවසෙන පුවත මාධ්‍ය තුළ ආවරණය වී තිබූ ආකාරය ගත හැක. ජනවාරි 12, 2022 දින මෙම පුවත සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය පුවත්පත්වල ප්‍රමුඛතාවයෙන් පළ වී තිබූ අතර, ඒ අතුරින් ඉංග්‍රීසි පුවත්පත් වාර්තා පිළිබඳ අපගේ නිරීක්ෂණ මෙසේයි.

1. ඇතැම් පුවත්පත් දිවි තොර කරගැනීම "committed suicide" ලෙසින් සඳහන් කර තිබුණි. එයින් අපරාධකාරී ක්‍රියාවක් හැඟවේ. ඒ ඔස්සේ, දිවි තොර කරගැනීම තුළින් ඇතිවිය හැකි සමාජ ගර්හාව තවත් තීව්‍ර විය හැකි බවත්, ඒ හේතුවෙන් "died by suicide" වැනි යෙදුමක් වඩාත් යෝග්‍ය වන බවත් ඒ පිළිබඳ මාධ්‍ය ආචාර ධර්ම පෙන්වා දෙයි.

2. හදිසි උපකාරක අංක සඳහන් කර නොතිබුණි. මහජන ලැදියාවට අයත් දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තා කිරීමේදී පවා හදිසි උපකාරක අංක පළ කළ යුත්තේ, එම පුවත කියවීමෙන් දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකුට, එම මනෝභාවයෙන් මිදීමට ඇති මාර්ගයක් හදිසි උපකාරක අංක තුළින් ලබා දිය හැකි නිසාවෙනි.

මේ පිළිබඳව ඔබේ අදහස් මොනවාද?

උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

හදිසි උපකාරක අංක:
CCCline - 1333
ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - 1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවිඩ මාර්ගයෙන් සම්බන්ධ කර ගත හැක)

මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Samaritans_Media...